# යොවුන් ප්‍රදීපය

සැදැහැවත්
බුද්ධිමත්
තාරුණ්‍යයේ
අරුණැල්ල

## යොවුන් දිවියට කිතුනු අත්වැල

ක්‍රිස්තු වර්ෂ 2026 මාර්තු 01 ඉරිද



කඳු මුදුනේ
අත්දැකීම
ප්‍රීතිජනක වුවද
ජීවිතයේ ඇත්ත
දැකිය හැක්කේ
මහපොළොවේ
ජීවත්වීමෙනි
සමිඳාණන් වහන්සේ
මහපොළොවේ සිට
සිය ජීවිතය පූජා කළේ
මිනිසුනට විමුක්තිය
උදා කර දීමටය

# ලාංකීය සමාජය කෙරෙහි නූතන සන්නිවේදනයේ බලපෑම

**වර්තමානයේ මිනිස් පරිසරයේ දියුණුව කොතරම්ද කිවහොත්, මිනිසාගේ මූලික අවශ්‍යතා වන ආහාර, ඇඳුම්, සන්නිවේදනය යනු, මිනිස් ජීවිතය පුරාවටම අඛණ්ඩව වර්ධනය වන ක්‍රියාවලියකි.**


මිනිසා සමාජීය සත්වයකු බැවින් එකිනෙකා සමඟ අදහස් අත්දැකීම්, හුවමාරු විය යුතු නිසා එය ඉතා සමීප සබඳතාවක් බවට පත්ව ඇත. අප ආදී මිනිසාට නිවැරදි භාෂා හැසිරවීමත් නොතිබුණෙන් ඔහුගේ හැඟිම් ප්‍රකාශ වුයේ ශබ්ද හෝ සලකුණු වැනි සරල ක්‍රම මඟිනි, ඒ ඔස්සේ ඔහු තම ජීවිත අවශ්‍යතා සපුරා ගත්තේද ඉතා සහයෝගී, මානුෂිය බැඳීමකින් යුතුවය. ක්‍රමයෙන් තාක්ෂණය දියුණු වත්ම, මේ සරල සන්නිවේදන මාධ්‍ය පුවත්පත්, ලිපි, ගුවන්විදුලිය, දුරකථනය ආදී ලෙසින් තවදුරටත් විකාශනය විය. එසේම 20 වැනි සියවස අගභාගය වෙද්දී, වැඩි ජනතා ප්‍රසාදයක් දිනාගනිමින් ''රූපවාහිනිය'' අප සමාජයට එක්විය ශ්‍රව්‍ය, දෘෂ්‍ය මාධ්‍යක් වූ රූපවාහිනිය මඟින්, දෙස් විදෙස් තොරතුරු ඉතා කඩිනමින් රූප රාමු සමඟම නැරඹිය හැකි වුවාසේම, අධ්‍යාපනික ප්‍රගතියට අදාළ වැඩ සටහන් විවිධ රෝග පිළිබඳවත්, ඊට ප්‍රතිකාර හා වෛද්‍ය සේවා පිළිබඳවත් රැකියා ලාභීන්ට හා රැකියාවන්හි නියුතුවන්නට පලදායක වැඩ සටහන්ද නැරඹිය හැකි වූ නිසා එය ජන දිවියට මහඟු අත්වැලක් විය. කල්යත්ම රූපවාහිනි වැඩ සටහන් වාණිජ්‍යත්වයට නැඹුරු බවත් දැක්වු අතර, අප සමාජ චර්යා ධර්ම වලට පටහැනිව යමින්, විවිධාකාර සමාජ විරෝධි ක්‍රියා වලට පොළඹවන රූප රාමුද අනවශ්‍ය වෙළඳ ප්‍රචාරනයන්ද විකාශනය විය.

ක්‍රමයෙන් 21 වැනි සියවස ඇරඹෙත්ම අප රට සන්නිවේදන මාධ්‍ය අතරට එක්වූයේ ''ජංගම දුරකථන'' යයි. එය සීග්‍රියෙන් බාල, තරුණ ජනකොටස්වල වැඩි ආකර්ෂණයක් දිනාගැනීමෙහි සමත් පරිහරණයට පහසු කුඩා ''මෙවලමක්'' විය. නූතන සමාජයට එක්වූ මේ සන්නිවේදන මාධ්‍යන් ලාංකික ජන සමාජය තුළ විශාල වෙනසක් සිදු කළා සේම, වටිනා මෙහෙවරක්ද සැලසු බව අප දනිමු. එමඟින් දැනුමද ප්‍රගුණ විය. ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් තුළ නව ආකල්ප ගොඩ නගන්නටත් කාලය ඉතිරි කර ගනිමින් නවීකරණය වන ලොව සමඟ ඉදිරියට ඇදෙමින් අනාගත සංවිධාන කටයුතු කාර්යක්‍ෂම කර ගැනීමටත් මේ මාධ්‍ය විශාල පිටුවහලක් විය. මේ ජංගම දුරකථන ''අන්තර් ජාලය'' ඔස්සේ අප ජන සමාජය තුළ ජීවත් වන බාල තරුණ පිරිස් බොහොමයකගේ සිතීමේ හැසිරීමේ වගේම ආකල්පමය වෙනකටද බලපෑය. අන්තර් ජාලය හරහා නව දැනුම නව රැකියා ව්‍යාප්ත වූ අතර නව හැකියාද එමඟින් වර්ධනය විය. පෙරට වඩා සමාජ සම්බන්ධතා ශක්තිමත් වූ අතර, දුරස්ව ජීවත් වන නෑදැ හිතමිතුරන් සමඟ සම්බන්ධතා පැවැත්වීමද පහසු විය. විවිධ සමාජ ගැටළු පිළිබඳව ජනතාව දැනුවත් කරමින්, ජන මතය ගොඩනැගීමටද මෙහි ඵලදායක ප්‍රතිඵල විය.

එසේ වුවද මේ නූතන සන්නිවේදන මාධ්‍ය තුළින් ජනතා සුභසිද්ධියට ඉවහල් නොවන හානිකර ක්‍රියා දාමයන් රැසක්ද සිදු වන බව අපට හැඟෙයි. අසත්‍ය ප්‍රචාර, වංචනික තොරතුරු ඒ හරහා පැතිර යෑමෙන්, ජන ජීවිතය අවුල් වී අසමගිය වර්ධනය වන සැටිත් අපට හැඟෙයි. එසේම අධික ලෙස මාධ්‍ය භාවිතයට නැඹුරුවීමෙන් මානසික ආතතිය කාලය නාස්ති වීම වැනි ගැටළුද මතුව ඇත. අධ්‍යාපන පහසුව තකා සසුනට මේ නූතන මාධ්‍ය හඳුන්වා දුන්නද, බොහෝ ළමා පිරිස් අසභ්‍ය දේට යොමුවීමෙන් දූෂිත බවට ගොදුරු වන සැටිත් දක්නට ඇත. ඇතැමුන් මේ ජංගම දුරකථන මඟින් මත්කුඩු ජාවාරම්, සොරකම්, පාතාල කල්ලි රටපුරා ක්‍රියාත්මක කරන සැටිත් අප දනිමු. වත්මන් පවුල් සංස්ථා දෙදරා යාමටද මේ නව මාධ්‍ය හේතුවී තිබේ. පෙරමෙන් දෙමාපිය දූ දරු සබඳතා ගිළිහී ගොස් තිබේ. මන්දයත්, බොහෝ පවුල් තුළ, පියවරු මව්වරු, දරුවන් හුදකලා වෙමින් මේ නව මාධ්‍ය ඔස්සේ කාලය කා දමමින් මනෝ ලෝකවල සැරි සරති. අද අප රටේ රිය අනතුරු බොහොමයකට හේතු කාරක වී ඇත්තේද, රියදුරන්, ''ජංගම දුරකථන ඔස්සේ'' යමින් රිය පැදවීමෙහි යෙදෙන නිසාවෙනි. මෙලෙස අදුරදර්ශිව මාධ්‍ය භාවිතා කිරීම මේ සියළු හානිකර සිදුවීම් වලට හේතුව වී තිබේ.

මෙතෙක් අප සමාජය තුළ සුරැකුනු යහපැවැත්ම ක්‍රමයෙන් පිරිහී යන බවත් පෙනී යන හෙයින්, වගකීමෙන් එක්තරා සීමාවක් තුළ මේවා පරිහරණය කිරීම ඉතා වැදගත් වේ. සමාජ සුභසිද්ධියට ඉවහල් වන නිවැරදි දේ තෝරා ගෙන භාවිතා කිරීමට වගකීමෙන් බැඳෙන්නට සිතා ගන්නේ නම් නූතන සන්නිවේදන මාධ්‍ය අපේ ජන සමාජයේ උන්නතියට හේතු වනු ඇත.

**එම්.එස්. රංජනී පෙරේරා**
දුන්ගල්පිටිය



# නිරාහාරය තුළින් සමිඳුන්ට ළංවෙමු

චතාරික සමයේ එන වැදගත්ම චාරිත්‍රයක් වන්නේ නිරාහාරශීලයයි. මෙහි බයිබලීය පදනම වන්නේ ක්‍රිස්තුන් වහන්සේ පාළුකරයේදී දින 40ක් තම ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කිරීමට පෙර නිරාහාරශීලය රක්ෂා කළ බවයි. චතාරික සමය තුළ ක්‍රිස්තුන් වහන්සේ හා සම්බන්ධ වීමට හා උන්වහන්සේ මෙන් වීමට යන ගමනේදී අපට අත්හැරීම පෙන්වා දෙන්නට මෙම සම්ප්‍රදාය බොහෝ සෙයින් වැදගත් වේ.

මේ අත්හැරීම චතාරික සමයේ අපගේ පශ්චත්තාපයට බොහෝ වටිනාකමක් ගෙන දෙනු ලබනවා. එමෙන්ම සාන්ත සභාව තුළ රීතියක් ලෙස අළු බදාදා සහ මහ සිකුරාදා දිනයන් තුළ නිරාහාරශීලය අනිවාර්යෙන් රක්ෂා කළ යුතු බව පෙන්වා දෙයි. එයින් අපට නිහතමානීකම, තමා විසින් තමා පාලනය කර ගැනීම හෝ අපි ඉතුරු කරගත් කිසියම් දෙයක් ඇත්නම් එය දුප්පතුන් සමඟ බෙදාගත යුතු බව පහදා දෙයි. මෙය හුදෙක් පුද්ගලික කරුණක් නොව එය සාන්ත සභාව තුළ කාලයක් තිස්සේ පැවතගෙන එනු ලබන ලස්සන සම්ප්‍රදායකි.

සාන්ත සභා ඉතිහාසයේ නිරාහාරශීලය ආරම්භ කළේ අසරණයන් සමඟ අප සැමවිටම සිටිනවා යන හැඟීම බෙදා ගන්නටයි. සාන්ත සභාව විශේෂයෙන්ම මෙය දයාවේ කටයුතු සඳහා භාවිතා කරන ලදී. මෙම දයාවේ ක්‍රියාවන් සිදු කළේ අපගේ මුදල්, භාණ්ඩ හෝ ආහාර වැනි ඕනෑම දෙයක් එකතුකර එය ආරක්ෂා කර පසුව එය දුප්පතුන්ට පරිත්‍යාග කිරීමෙනි. එමෙන්ම සාන්ත සභා ඉතිහාසයේ, මුල් කිතුනු සභාවේ තිබුණේ වැඩිහිටි බෞතිස්මයයි. මෙහි ප්‍රධාන කොටස් 2 කි. එනම් පිළිග ැනීමේ කොටස හා ස්ථාපිත කිරීමේ පිළිවෙත ලෙස ඒවා හඳුන්වයි. මේ පිළිගැනීමේ කොටසට සූදානමක් ලෙස සාන්ත සභාවේ චතාරික කාලය තුළ ක්‍රිස්තියානි දහමට පැමිණෙන්නට සූදානම් වන වැඩිහිටියන් නිරාහාරශීලය රැකිය යුතු බව ඔවුන් අවධාරණය කර තිබුණි.

ඊට අමතරව අපේ සාන්ත සභා ඉතිහාසය තුළ විවිධ කාලවලදී විවිධ හේතූන් මත නිරාහාරශීලය රක්ෂා කර ඇත. විශේෂයෙන්ම සාංඝික ජීවිත ගත කරන පියවරුන් හා කන්‍යාසොයුරියන් වැනි අය විවිධ කාල තුළ විශේෂයෙන් සිකුරාදා දිනවල මේ නිරාහාරශීලය රක්ෂා කිරීමේ පිළිවෙතක් හා සම්ප්‍රදායක් අනුග මනය කර තිබුණි. සාන්ත සභාව තුළ පියවරුන් ප්‍රධාන කොටස් 2 කට බෙදේ. එනම් ආරණ්‍යවාසී සභා පියවරුන් හා කාන්තාර සභා පියවරුන් ලෙසයි. මේ පියවරු සියලුදෙනාම නිරාහාරශීලය ඉතාමත්ම වැදගත් සම්ප්‍රදායක් ලෙස පිළිපදිනු ලබනවා. උදාහරණයක් ලෙස කාන්තාරයේ ශු. අන්තෝනි මුනිතුමා හා ශු. බෙනඩික් මුනිතුමා මේ නිරාහාරශීලය සහ යාතිකාව තම ජීවිතවල ප්‍රධාන අවියක් කරගනු ලැබුවා.

ඒ හා සමානව ජුදා සම්ප්‍රදායේ නිරාහාරශීලය, අපේ ක්‍රිස්තියානි නිරාහාරශීලයට බොහෝ බලපෑම් ඇති කරනු ලැබුවා ඔවුන් ''යොන්කිපුර්'' නම් විශේෂ උත්සවයක් පවත්වනු ලබනවා. එනම් උත්සවයට පෙර ජුදා සම්ප්‍රදාය බොහෝ විට තම පව් වලට මනස්ථාපනය වීම සඳහා මේ නිරාහාරශීලය අවියක් ලෙස ඔවුන් භාවිතා කරනු ලැබුවා. එයින් ඔවුන් ඔවුන්ගේ ජීවිත වෙනස දෙවියන් වහන්සේට පෙන්වාදීමට උත්සහ කළහ. පසු කාලයකදී අපගේ කතෝලික සභාව විසින් මෙම සම්ප්‍රදායන් අපගේ කතෝලික සභාවට ඇතුළත් කරන ලදී.

මධ්‍යතන යුගයේ දී සභාවේ බොහෝ කරුණු නවීකරණයට පත් විය. මේ තුළ විශේෂයෙන්ම මේ ජනවන්දනා කැලැන්ඩරය තුළට සහා නීති ලෙස මේ සියල්ල ඇතුළත් වූයේ මෙම මධ්‍යතන යුගයේ අවසාන කාලයේදීය. ඉතින් අපගේ කතෝලික සභාව තුළ පාස්කු මංගල්‍ය සැමරීමට පූර්ව සූදානමක් ලෙස මෙම නිරාහාරශීලයේ සම්ප්‍රදාය පැවතගෙන එනු ලබනවා. අපිත් මේ චතාරිකය හැකිතාක් නිරාහාරශීලයේ නිරත වී ජේසුස් වහන්සේට තව තවත් ළං වීමට උත්සහ කරමු.

විශ්මි අමායා
ලොයොලා විදුහල
බෝපිටිය



# චතාරිකයට මෙනෙහි කිරීමක්

**පාස්කු මංගල්‍යයට සූදානම් වීමේ කාලය කොරොස්ම හෙවත් චතාරික කාලය පෙබරවාරි 18 අළු බදාදායින් අරම්භ වේ. කිතු සමිඳුන්ගේ දුක්ප්‍රාප්තිය මරණය, උත්ථානය මේ කාලය තුළ අප සිහිපත් කරමු.**

කිතු සමිඳුන්ගේ දුක් ප්‍රාප්තිය ආරම්භවන්නේ ජෙත්සෙමෙනි මල් උයනෙන්ය. ඒ සුන්දර පරිසරය තුළින් එතුමාගේ දුක, කඳුල, වේදනාව, තනිකම අත්දකින්න සිදුවිය. දූ පුතුන් දෙමව්පියන් එකට එකතුව ගතකළ ලස්සන පවුල තුළම අද ඔවුන් දුක් විඳිනවා නේද? වයසක දෙමාපියන් වැඩිහිටි නිවාසවල නැත්තම් දරුවන්ගෙන් ඈත්වී තනිවී සිටි. ඇතැම් දරුවන් පිටරටය. මුදල් හදල් තිබුණත් දරු මුණුබුරන්ගෙන් ඈත්වී ජීවත්වීම දරාගන්න බැරි වේදනාවකි.

එදා පිලාත් තම බලය නිලය රැකගැනීමට කිසි වරදක් නැති ජේසු සමිඳාණන්ම මරණයට තීන්දු කළා ද අදත් එවැනි අසාධාරණ තීන්දු නිසා වරදකරුවන් නිදහසේ සිටිද්දී නිවැරදි කරුවන් දඬුවම් විඳින්නේ නැද්ද? තමන්ට පක්ෂපාත නැති අය මරාදමන්න අතුරුදහන් කරන්න. ඔවුන්ගේ රැකියා අහිමි කිරීම් සිදුවී නැද්ද? ඔවුන් නිහඬ කරන්න අදත් එදාවගේ පිලාත්ලා අප අතර සිටිනවා නේද?

අද අප, අප ගැනම සිතා බැලුවොත් දූ දරුවන්ගේ හිතුවක්කාරකම්, රැකියා නැතිකම, නරක පුරුදුවලට ඇබ්බැහි වීම, ආර්ථික අහේනිය නොයෙකුත් ප්‍රශ්න නිසා තමන්ට ලැබුණ කුරුස ගෙනයා නොහැකිව දෙමාපියන් කී දෙනෙක් අසරණවී ඇද්ද? එදා කිතු සමිඳාණන් කුරුසේ බරින් කීප වාරයක් බිම ඇද වැටුනාද? එසේම අදත් දෙමාපියන්, තරුණ දූ පුතුන් නොයෙකුත් ප්‍රශ්න නිසා ඇද වැටුන අවස්ථා බොහෝය. මේ ප්‍රශ්න වලින් සහනයක් ලබා ගැනීමට ක්ෂණික විසඳුම් සෙවීමට නොයෙකුත් මිථ්‍යා විශ්වාසයන් සොයා යන අවස්ථා නැද්ද? මෙහොතක් සිතා බලමු.

අද පවතින ආර්ථික ප්‍රශ්න හේතුවෙන් මුදල් සෙවීමට මව්වරු කී දෙනෙක් දරුවන් නැතිකර දමා විදේශ ගතවී ඇද්ද? මේ හේතුවෙන් දරුවන් නොමග ගිය ද පවුල් විනාශවී ඇද්ද? අද ඇතැම් මව්වරුන්ට තම දරුවන්ට ආදරයක් සෙනෙහසක් නැත. දරුවන් කුස තුළම විනාශ කරති. උපන් දරුවන් මහ මග දමා යති. මෙවැනි මව්වරුන්ට දේවමාතාවන් කදිම ආදර්ශයකි.

එදා සීමොන් සිරනේවුස් ජේසුගේ කුරුසියට අත තබමින් කුරුසියේ බර මඳකට හෝ සැහැල්ලු කරන්න උදව්වුවා. එසේම වෙරෝනිකා නම් කාන්තාවද ලේ ඩහදිය කඳුලින් පිරි ජේසුගේ මුහුණ තම අතවූ රෙදි කඩින් පිස දැමුවා. ඒ වගේම අදත් උසුලා ගත නොහැකි දුක, වේදනාව විඳින, අසරණ, තනිකම නිසා විරූපි වී සිටින අය කෙතරම් දෙනෙක් අප අතර සිටිනවාද? මෙවැනි අයගේ දුක වේදනාව මඳකට හෝ නැතිකර ඔවුන් නගා සිටුවීමට අපට හැකිනම් අනිකා වෙනුවෙන් කැප වන්නට ඔවුන්ට පිළිසරණක් වන්නට වෙරෝනිකා, සිමොන්ලා වෙන්නට අපට නොහැකිද?

සුරාවට සුදුවට යොමුවී සිටින සැමියන් නිසා දුක්විඳින බිරියන්, විෂමත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ පුතුන් නිසා හඬන මව්වරු කොතෙක් ඇත්ද? අනාගතය අඳුරු කරගත් දූවරු, නොදැනුවත් කමින් අපචාරයට ලක්වූ දරුවන් නිසා අඩා වැටෙන මව්වරු කොතෙක්ද? ඒ තරුණ බාල දරුවන් එයින් මුදාගන්න උත්සාහ කරමු.

එදා ජේසුව නිරුවත් කළාසේ අද සමාජයේ කොපමණ දෙනෙක්ව අප නිරුවත් කරනවාද? බොරු කේලම්, නැති වැරදි ඇති කරමින් අනිකා පහතට ඇද දැමීමට කටයුතු කරනවාද? මේ චතාරිකයේ ඒවායින් මිදීමට ඉටා ගනිමු. ආත්මික හා ලෞකික නිරුවතින් මිදෙමු.

මිනිස් අපගේ ජීවිතයද කුරුසියේ පාද නමස් කාරයක් වැනිය. ඒ කුරුස අප සතුටින් බාර ගනිමු. අපගේ යුතුකම් ඉටු කරමු. ජේසු සමිඳාණන් කුරුසේ මරණයට පත්වී උත්ථානය තුළින් ජයග්‍රහණය ලැබුවාසේ අපත් අපගේ ජීවිත නියම අරමුණක් කෙරෙහි ගමන් කරවමින්, අපගේ දුක, වේදනාව, තනිකම කුරුසියේ ඇණ ගසමින් අපගේ පාපි ජීවිතය වල දමා නව ජීවිතයකට උත්ථාන වෙමු. සදාතන ජීවිතයකට සාක්ෂි ලබා ගනිමු.

**පිලම්නා මැන්දිස්** - මොරටුව.



# සාන්ත දොමිනික් සාවියෝ මුනිතුමා

**වර්ෂ 1842 අප්‍රේයෙල් මස 03 වන දින චාල්ස් සාවියෝට සහ බ්‍රිජට් සාවියෝට ප්‍රීතිජනක දිනයකි. ඔවුන්ගේ පුංචි පැලට සිරියාව රැගෙන පුංචි පැටියෙක් මෙලොව එළිය දුටුවේය. ඔවුන් පදිංචිව සිටියේ ඉතාලියේ මූර්තානා නගරයේ පිහිටි මුරිඅල්ඩෝ ග්‍රාමයේය. අලුත උපන් දරුවාට දොමිනික් යන නම තබන ලදී. මව් සෙනෙහසේ උණුසුමටත් තුරුල්වී පිය සෙනෙහසේ කඳුළු වලින් ජීවිතය ඇරඹූ කුඩා දොමිනික් කුඩා කල සිටම ධෛර්යවන්ත දරුවෙකු විය. දුප්පත්කමේ අන්තයේ සිට තම පවුල ගැන කිසි විටෙක ලැජ්ජා නොවූ මේ දරුවා මොන අඩුපාඩුකම් තිබුණත් කිසි දිනක මැසිවිලි දෙඩුවේ නැත. මවගෙන් බොහෝ දේ උගත් දොමිනික් නිවස අසල පිහිටි පාසලෙන් සිප්සතර හැදෑරුවේය.**

නිවස අසල පිහිටි දෙව්මැඳුරට හිමිදිරි උදයෙන්ම යන දොමිනික් වයස අවු. 05 දි පමණ පූජා උදව් ළමයකු ලෙස කටයුතු කළේය. ඔහු කුඩා කල සිටම දේව අම්මාටත්, ජේසු තුමාටත් ආදරය කළේය. ඒ කාළයේ පළමුවරට දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට නම් වයස අවු. 12 පමණ වනතුරු සිටිය යුතුය. වයස අවුරුදු 07 සිට මීසම් භාර පියතුමාගෙන් ජේසුව ලබා දෙන ලෙස නිතර නිතර ඉල්ලා සිටියේය. පියතුමා ඔහුගේ භාක්තියත් ආශාවත් දුටු නිසා වයස අවු.07 දී ඔහුට මෙසේ කීය. ‘‘මම පාස්කුවට ඔබට ලස්සන තෑග්ගක් දෙන්ට යනවා. එදින මම ඔබට ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාදය මගින් ජේසුව දෙනවා’’. දොමිනික් උඩ පැන පැන අත්පොලසන් දී පිම්මේ දිව ගොස් තම දෙමව්පියනට මේ ආරංචිය දැන්වීය. ඉන්පසු සැමදාම මහත් භක්තියෙන් ඔහු දිව්‍ය සත්ප්‍රසාදය ලබාගත්තේය.

ඔහු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන දින ජේසුට වූ පොරොන්දු මෙසේ සටහන් කර තැබීය:

01. මට පුළුවන් සැම අවස්ථාවකදීම පාපොච්චාරණය කිරීමට හා ජේසුව ලබා ගැනීමට පොරොන්දු වෙමි.
2. ඉරුදින හා නිවාඩු දිනයන් සම්පූර්ණයෙන්ම දෙවිඳුනට කැප කරමි.
3. මගේ හොඳම මිතුරන් ජේසුතුමා හා මරිය තුමිය බවට පත්කර ගනිමි.
4. මම මැරුණත් කිසි විටෙක මරණීය පාපයක් නොකරමි.

මෙම සතරවන පොරොන්දුව ඔහුගේ ඉදිරි ජීවිත කාලයේ ප්‍රධානතම අරමුණ විය. ඔහු කිසිවිටෙකත් මරණීය පාපයන් කිරීමට තියා ඒ ගැන සිතුවේවත් නැත. මෙලෙස සිටින අතර දොමිනික්ට දොන් බොස්කෝ පියතුමා යටතේ සිටීමට අවස්ථාව උදාවිය. වර්ෂ 1854 දි දොන් බොස්කෝ පියතුමාගේ නිවසේ සැදුණු වැඩුනු ඔහු, එහි සිටි අනෙකුත් මිතුරන් සමග සෙල්ලම් කරමින් වතුපිටි වල වැඩ කරමින් නිතරම යාච්ඤා කරමින් සැමගේ හොඳ හිත දිනා ගනිමින් කාලය ගත කළේය. ඔහු සැමවිටම වැරැද්දක් කිරීමට නොසිතූ අතර මිතුරන්ගේ වරදක් දුටු විට එය පෙන්වා දුන්නේය. තවද එම දෙන වැරදි බවට ඔහු සිතන්නේ ඇයි ද යන්න පෙන්වා දුන්නේය.

දිනක් එකිනෙකා සමග අමනාපයෙන් සිටි ඔහුගේ මිතුරන් දෙදෙනෙකු අඬදබරයකට සූදානම් වනු දොමිනික්ට ආරංචි විය. ඔහු එම මිතුරන් දෙදෙනාගේ අදහස වෙනස් කිරීමට කෙතරම් උත්සාහ කළද එය ගඟට කැපූ ඉනිමෙන් විය. පසුව අවසානයේ සටනට පෙර එක් රහස් කොන්දේසියක් ඉදිරිපත් කිරීමට ඔවුන් පොරොන්දු කරගෙන සටන ආරම්භ කළේය. සියල්ල සූදානම් කර සටනට පෙර රහස හෙළිකළ දොමිනික් දෙදෙනාම පළමු කොට තමාට පහර දෙන ලෙස ඉල්ලා සිටියේය. ‘‘ඒත් දොමිනික් ඔබ අපට කිසි වරදක් කරලාවත් රිද්දලාවත් නැත. අනික ඔබ අපේ මිතුරෙක්’’ යැයි ඔවුන් පැවසීය. මිතුරන් දෙදෙනා ලැජ්ජාවෙන් ගල් ගැසුනි. ඉක්මනට ඔවුන් අතවූ ගල් ගිලිහී ගියේය. මේ සිදුවීම දොමිනික් කවදාවත් කා සමගවත් ප්‍රකාශ කළේ නැත. මිතුරන් දෙදෙනා අනෙක් මිතුරන් සමග නොකීවානම් කිසිදිනෙක මෙම තොරතුරු අනාවරණය වීමට ඉඩ නොතිබුණි.

මේ යහපත් දරුවාට ජීවත් වීමට ලැබුනේ අවුරුදු 15ක් පමණ කෙටි කාලයකි. 1857 දී ඔහු රෝගී තත්වයට පත් විය. ක්‍රමයෙන් අසාධ්‍ය තත්වයට පත්වීම නිසා අන්තිම ආලේපය පවා දානය කරන ලදි. අවසානයේ දොන් බොස්කෝ පියතුමා මොහුව විවේකය සඳහා නිවසට යැවීය. එහෙත් ඉතාම අසාධ්‍යතත්වයට පත්විය. කිසිදිනක මරණීය පාපයක් නොකළ පිරිසිදු ආත්මයකට හිමිකම් කී පවිත්‍රත්වයේ ප්‍රතිමූර්තියක් බඳුවූ දොමිනික් සාවියෝ 1857 මාර්තු මස 09 දින ‘‘කොතරම් පියකරු දසුනක් ද මට දර්ශනය වන්නේ’’ යයි කියමින් ස්වර්ග යේ සදාතනික නිවහනට ගියේය. දොමිනික් ස්වර්ගස්ථ වීමෙන් පසු ඔහුගේ මිතුරන් ඔහුගේ මැදිහත්කම පතා නිතරම යාච්ඤා කළ අතර ඔහු නිතරම ඔවුනට පිහිට විය. ඔහුගේ මිතුරන්ට ඔහුගේ මැදිහත් කම තුළ නිතරම සුවවීම් හා වෙනත් පුදුම ප්‍රාතිහාර්යයන් සිදුවිය. දොමිනික් තුමන්ව දසවැනි පියුස් පාප්තුමා විසින් 1950 දි භාග්‍යවරයට ඔසවන ලද අතර එතුමා විසින්ම 1954 දි දොමිනික් තුමන්ව ශුද්ධවරයට ඔසවන ලදී. ඔහු යොවුන් අයගේ, පූජා උදව් දරුවන්ගේ හා ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන ළමුන්ගේ ද සාන්තුවරයාය. මෙතුමාගේ මංගල්‍යය මාර්තු මස 10 දිනට යෙදී ඇත.

**ප්‍රියන්ති ජසින්තා මෙන්ඩිස්**
‘‘ෆෙදර්’’ උතුරු පයාගල





# ශුද්ධවූ පැයේ හාස්කමක්




මිනිසුන් ආගම ඇදහුවාට වඩා විශ්වාසවන්ත ලෙස කරන්නේ නම් එහි ප්‍රතිඵල විශිෂ්ටය. එයට සාක්ෂියක්ය මේ. මෙම කතාවට සම්බන්ධවුයේ එක්තරා දෙදරු මවකි. ඇගේ ශරීරයේ එක් කොටසක පිළිකාවක් නැගී එන බවත් අහඹු පරීක්ෂණයකින් දැන ගන්නට යෙදුනි. එය වරින්වර සෝදිසිකර බලන ලෙස වෛද්‍යවරුන් උපදෙස් දී තිබුණි. නමුත් එය කාලයක් යද්දී මගහැරී ගියේ එයින් වේදනාවක් නොවුනු බැවිනි.

මෑතකදී ඒ මම වාහනයක් පදවාගෙන යද්දී ඉදිරිපස වාහනයක ගැටී වාහනය තදබල ලෙස අබලන් වී තිබුණි. මව ඉදිරිපස සුස්කානමේ හිස වැදී නාසය තදින්ම තුවාල වී තිබුණි. වහාම ඇයව රාගම රෝහලට යොමුකර පාලාස්ටික් සැත්කමක් මගින් යථා පරිදි සකස් කෙරුනි. ඒ සැත්කම් කළ වෛද්‍යවරයා ඒකී සැත්කම අවස්ථාවේදී මේකී මවගේ පිළිකාවක් ඇතැයි සැක කළ ස්ථානය බලා වහාම එයට ප්‍රතිකාර කරන ලෙස දන්වා ඇත.

පසුව නාසයෙ පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය වූ පසු මේ සඳහා පරීක්ෂණ අරඹා තිබේ. පිළිකාව ඇතැයි සැක කරන පෙදෙසින් කොටසක් ගෙන වැඩිදුර පරීක්ෂණ සඳහා අදාල සායනයට යවන ලදි. මේ සියල්ල කෙරෙද්දි නිවසේ හා නැදෑ හිතමිතුරන් අඛණ්ඩ යාච්ඤාවේ නිරත වී ඇත.

අවසානයේ පරීක්ෂණවල ප්‍රතිඵල ලැබෙන දින නිවසේ සැවොම එක්වී චතාරිකයටත් පෙරාතුව ශුද්ධවූ පැයක් කරන ලදි. එය ඉතා බලගතුව සිදුවී ඇත. ශුද්ධවූ පැය අවසානවත්ම යථෝක්ත මවගේ දුරකතනයට වෛද්‍යවරයාගේ වාර්තාව සඳහන් වන පණිවිඩයක් ලැබිණ. එහි වූයේ පරීක්ෂණය ඉතාමත් සාර්ථක බවත් කිසිදු පිළිකා සටහනක් නොමැති බවත්ය. තවත් සුලු ප්‍රතිකාරයක් තිබුන ද නැත්තටම නැතිකර ගත හැකි බව වැඩිදුරටත් දන්වා තිබුණි. ස්වාමින් වහන්සේට ප්‍රශංසා වේවා නිවසේ සියල්ලෝම එතැනට දණගසා දෙවි මහෝත්තමයාණන්ට ස්තූති ප්‍රශංසා කරනලදි. මේ සතියෙන් මුළු ජනතාවටම දැනගත හැකි කාරණය නම් අඛණ්ඩ යාච්ඤාවත්, ශුද්ධවූ පැයත් අපේ ඕනෑම බැරෑරුම් අවස්ථාවකදි අපට එකහෙලාම පිහිට වන බවයි. යමෙක් විශ්වාසයෙන් යුතුව දෙවිඳුනට මොර ගසන්නේ නම් උන්වහන්සේ ක්ෂණිකවම අපට පිහිට වනවා සිකුරුයි. වාහනය ගැටීමේ අයහපතින් බලගතු ප්‍රශ්ණයක් නිරාකරණය කරගැනීමේ යහපත උදාවී ඇත. දෙවිඳුන්ට ස්තෝත්‍ර වේවා!

කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි



# තරුණ ජීවිත ප්‍රගමනයේ ආධ්‍යාත්මික තෝතැන්න

## යොවුන් ප්‍රදීපය

**ඔබේ සිතැඟි සංකල්පනා, නිර්මාණ හෝ හරවත් ලිපි සහ මීසමේ, දේවස්ථානයේ තරුණ ක්‍රියාකාරකම් පිළිබඳ ඡායාරූප සමග ප්‍රවෘත්ති**

**0777 186571** අංකයට Whatsapp කරන්න.




# ඩිජිටල් ලෝකයෙන් පාළුකරයට

**උපවාසව, දන්දීම හා යාච්ඤාව යන චතාරික කාලයේ මූලික භක්ති අභ්‍යසායන් එකිනෙක අතර ඇත්තේ ඉතා සමීප සබඳතාවයකි. අප උපවාසයෙන් ඉතිරිකර ගන්නා දෙය දිළිඳුන්ට පරිත්‍යාගි කිරීමත්, එයින් ලබා ගන්නා ආත්ම දමනය හා චිත්තවේගයන් පාලනය කරගැනීමෙන් ලබාගන්නාවූ පන්නරය තුළින් ගැඹුරු යාච්ඤා දිවියකට ඇතුලුවී, ආත්ම සෝදිසිය මගින් ජීවිත වෙනසක් කරා යොමු වීමක් කරා මෙම චතාරික භක්ති අභ්‍යාසයන් අපව යොමු කරවනු ලබයි. අප අළු බදාදා මෙනෙහි කළ ශුභාරංචිය තුළින් ක්‍රිස්තුන් වහන්සේ අපට මතක් කර දුන්නේ උපවාසය, දන්දීම හා යාච්ඤාව සඳහා අප යොමු විය යුත්තේ අන් අයට පෙනෙන්නට අපගේ ශ්‍රද්ධාව ප්‍රදර්ශනය කරන්නට නොව, රහසින් කරන දේ දකින හා අපගේ පිරිසිදු චේතනා දන්නා දෙවියන් වහන්සේට අප උත්සාහයන් පූජාවක් කොට පුදකළ යුතු බවයි.**

සාම්ප්‍රදායිකව අප උපවාසය නැතහොත් නිරාහාර ශීලය හෝ එක්වරුශීල රැකීම යන්නෙන් අදහස් කළේ, පසැතුවිල්ලේ හා අධ්‍යාත්මික අවධානයේ ක්‍රියාවන් ලෙස, සාමාන්‍යයෙන් අප ලබාගන්නා ආහාර ප්‍රමාණය උවමනාවෙන්ම අඩුකිරීම හෝ ඒවායින් හැකිතාක් දුරට වැලකි සිටීමය. එහෙත් නියම උපවාසය යනු අපගේ හදවත් දෙවියන් වහන්සේගෙන් ඈත් කරන කුමන හෝ ක්‍රියාවන්ගෙන් වැලකී සිටීම ලෙස හැඳින්විය හැකියි. එදා ක්‍රිස්තුන් වහන්සේ දින 40 ක් පාළුකරයේ නිරාහාරව ගත කළේ, තමන්ට හුරු පුරුදු වටපිටාවෙන් හා ක්‍රියාකාරකම් වලින් ඈත්ව, විශේෂයෙන් දෙවියන් වහන්සේගෙන් උන්වහන්සේව ඈත් කරන, සියලු දේ වලින් වැලකී මූලිකව පියාණන් වහන්සේගේ කැමැත්ත අවබෝධ කර ගැනීම සඳහාය. ඒත් වර්තමානයේදී උපවාසය යනු හුදෙක් ආහාරපාන වලින් වැලකී සිටීමට වඩා මිනිස් දිවිය හැඩගස්වන, එමගින් දෙවියන් වහන්සේගෙන් අපව ඈත් කරන, නව යථාර්ථයන්ගෙන්ද ඈත්වී වැලකී සිටීම ලෙස අපට හැඳින්විය හැකිය. මන්ද ජේසුස් වහන්සේම අපට පෙන්වා දුන්නේ උපවාසය බාහිර ක්‍රියාවක් නොව, අභ්‍යන්තර පරිවර්තනයක් සඳහා යොමු කරවන්නක් බවය. අද සමාජය දෙවියන් වහන්සේගෙන් පමණක් නොව එකිනෙකාගෙන් ද වෙන් කරන, ඈත් කරන, හුදකලා කරන සමාජ මාධ්‍ය, මාර්ගගත විනෝදාස්වාදය නැතහොත් Facebook, You Tube, Instagram වැනි මාධ්‍ය ප්‍රවාහයන්ගෙන් සමාජයේ බොහෝ දෙනෙක් අනවශ්‍ය කාලයක් ඒවා සඳහා දීමට හෝ ඇබ්බැහිවීම් වලට පෙළඹී සිටින නිසා, නූතන යුගයේ මූලික චතාරික අභ්‍යාසයක් ලෙස ඩිජිටල් උපවාසය ඉතා වැදගත් බව පෙන්වා දිය හැකිය. ප්‍රබල විද්‍යුත් මාධ්‍යයන් මිනිස් සබඳා හා මානවිය ගුණාංග අවශෝෂණය කර අපගේ ඇතුළාන්ත අධ්‍යාත්මික ජීවිතය දුර්වල කරමින් සිටින යුගයක අපි ජීවත්වෙමින් සිටිමු. එවැනි පරිසරයක් තුළ ඩිජිටල් උපවාසය යනු නිහඬතාවය, අවධානය, යාච්ඤාව හා මෙනෙහිකිරීම තුළින් සමාජයේ තිබිය යුතු අව්‍යාජ ධාර්මික සබඳතා සොයා ගොස්, ඒවා අපගේ ජීවිතයට ඇතුළත් කරගැනීමට කෙරෙන ආරාධනයකි.

ඩිජිටල් උපවාසය යනු මේ උපාංග පරිහරණය මුළුමනින්ම අත්හැරීම නොව, ඒ තුළින් වඩා යහපත් හා ප්‍රයෝජනවත් දේ සඳහා යොමු වීමයි. එලෙස යාච්ඤාව, ශුද්ධ ලියවිල්ල කියවා ඒ ගැන මෙනෙහි කිරීම, සාන්තුවරයින්ගේ ජීවිත කථා කියවීමෙන් අධ්‍යාත්මික ජ්වලිත කමක් ලබාගැනීම සහ දේව ධාර්මික සත්‍යතාවයන් ගැන ගැඹුරින් අධ්‍යයන කිරීම වැනි යහත් දෑ සඳහා සමාජ මාධ්‍ය යොදා ගැනීමට ඇති අවකාශය විවරවී දෙවියන් වහන්සේ හා අන් අය සමග අරුත්බරව ලබාගැනීම සඳහා ද, විශේෂයෙන් දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව සඳහා ද, පුද්ගලික හා පවුලේ යාච්ඤාව යන භක්ති අභ්‍යාසයන් කෙරෙහි ද අපගේ අවධානය යොමුකිරීමේ මානසිකත්වයක් ගොඩනගා ගත හැකිය.

ඒ නිසා හුදු විනෝදය හා වින්දනය සඳහා මේ සමාජ මාධ්‍යයන් යොදාගෙන නිකරුනේ කාලය නාස්ති කිරීම වෙනුවට වඩා ඵලදායි අධ්‍යාත්මික පෝෂණය සඳහා යොදා ගැනීමට මේ චතාරික කාලයේදී අදිටන් කර ගනිමු. ඩිජිටල් උපවාසය මගින් මේ මාධ්‍යයන් භාවිතා කිරීම වගකීමෙන් අවම කරගත හැකිනම් ප්‍රයෝජනවත් දෑ සඳහා යොමුවීමට අවැසි කාලය, පැහැදිලි මනස හා අන් හැමදෙයකටම වඩා දෙවියන් වහන්සේගේ හඬට සවන්දීමට ඇති අවකාශය උදාවීමත් සමග මානසිකව මෙන්ම අධ්‍යාත්මිකව ද සාමය හා සැනසීම අත්දැකීමට හැකිවේ.

එවිට දිනෙන් දින දුර්වල වෙමින් පවතින මානවිය සබඳතා ශක්තිමත් කර ගැනීම සඳහා අවැසි කාලය සොයාගැනීමටත්, එහි ප්‍රතිපලයක් ලෙස දෙවියන් වහන්සේ හා සමග අප සබඳතාවය ශක්තිමත් කරගැනීමටත් මාර්ගය පාදාදේ.

උපවාසයේදී ආත්ම දමනයට වඩා අපට අවස්ථාව ලැබෙන්නේ අපව පාලනය කරන විවිධාකාර යහපත් හා අයහපත් බලවේගයන් මොනවාදැයි අනාවරනය කර ගැනීමටය. එමනිසා ඩිජිටල් උපවාසය, නැතිනම් අහිතකර හා ප්‍රයෝජනයක් නොමැති සමාජ මාධ්‍ය පරිහරණය කිරීම අපට පාලනය කරගත හැකිනම්, එවිට චතාරික කාලය තුළ මිනිසුන් හා දෙවින් වහන්සේ අතර ගොඩනගා ගත හැකි අපූර්ව සබඳතා මත අප ජීවිත වඩාත් අරුත්බරව ගත කිරීමට හැකියාව ලැබෙනවා නොඅනුමානය.

**අතිගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා**

# කිතුනු ඇදහිල්ලේ සාක්ෂිකරුවෝ

"යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝ ය ඔව්හු දෙවියන් දකින්නෝ ය."

## යේමනයේ කිතුනු හිංසනය කවර මුහුණුවරක් ගෙන ඇද්ද?



යේමනයේ වෙසෙන කිතුනුවන් මුහුණ පා සිටින හිංසනය දිගින් දිගටම ක්‍රියාත්මකව වඩ වඩාත් උත්සන්න වනු දක්නට හැකිවන්නේ රට තුළ පවතින ගැටුම්, මූලධර්මවාදය, අන්තවාදය හා ආර්ථික බිඳවැටීම් මධ්‍යයේය. එරට ප්‍රධාන වශයෙන් සමන්විත වනුයේ වෙන් ආගම් වලින් සිත් හැරීමෙන් එක්වන සැදැහැවතුනගෙනි. මෙහිදී ඔවුනට අතිශයින් රහස්‍ය අන්දමින් ආගම ඇදහීමට සිදුවේ. කිතුනුවකු යැයි හඳුනා ගනු ලැබුවහොත් මරණය නියත අතර දික්කසාදයෙන් හා දරුවන්ගෙන් වෙන්වීම නිසාද දැඩි දඬුවම් වලට මුහුණ දීමට සිදුවේ. නීතියේ ආධිපත්‍යය අතිශයින් දුබල වීම, යේමනය කැඩී බිඳී බිඳවැටීම නිසාද අනිටු විපාකවලට මුහුණ දීමට සිදුවේ.

බලධාරීන් හමුවේ ඉස්ලාමීය නොවන කංඩායම් ලියාපදිංචි නොකරන අතර ඉස්ලාමීය නොවන වන්දනා ස්ථාන වලට වසර ගණනාවක සිට අවසර දෙනු නොලැබේ. යේමන ජාතිකයන් නොවන අන්‍ය ජාතික කිතුනුවන් පවා රටින් පැන යන්නේ හිංසනය අතිශයින් බරපතල බැවිනි. ලියා පදිංචිය ලත් කිතුනු සභා ගණනාවක් අසාදු ලේඛන ගත කර හෝ විනාශ කර ඇත. මෙහි තේරුම වන්නේ යේමනයේ රට වැසි කිතුනුවන් වෙනත් ආගම් වලින් කිතු දහම වැළඟත් අය නිසා ඉතාමත් රහසිගතව ජීවත් වීමට සිදුව ඇත. රහසිගතව කිතු දහම ඇදහීමට බලකරන සමාජයක් තුළ යම් හෙයකින් අනාවරණය වීම මරණය වැළඳ ගැනීමක් බඳුය.

## සූඩානයේ කිතුනු හිංසනයේ හැඩරුව ඔබ දන්නවාද?



සූඩානයේ කාලයක් තිස්සේ කිතුනුවන්ට බරපතල හිංසන එල්ල කිරීම සිරිතක්ව පැවති අතර මෑතක පටන් කිතුනුවන් උන්හිටි තැන්වලින් පළවා හැරීම, බරපතල ශාරීරික හා මානසික අඩන්තේට්ටම් වලට ගොදුරු කිරීම මගින් මර්දනය දරුණු ලෙස දියත්වේ. 2021 දී හමුදාව පාලනය බාරගත් අතු 2023 පටන් අමානුෂික සිවිල් යුද්ධයක් ඇරැඹිණි. බොහෝ දෙව්මැඳුරු ගොඩනැගිලි බෝම්බ දමා පුපුරුවා හැර තිබේ. සමහරක් සටන්කාමීන්ගේ නවාතැන් පොළවල් බවට පත්ව ඇත.

ඉපැරැණි ඉස්ලාමීය නීති උපයෝගි කරගනිමින් කිතුනුවන් බරපතල විනාශයක හෙළමින් සිටී. ඉස්ලාම් දහම හැරදා කිතු දහම වැළඳගත් කොයි කවුරුත් මහත් බියෙන් වෙසෙති. දෙව්මැඳුරු වසා දැමීම, සන්නද්ධ කල්ලිවල නේවාසිකාගාර බවට පත්වීම නිසා කිතුනුවෝ සැඟවී ජීවත් වෙති. සුඩානයේ කිතුනුවෝ නිරන්තර බියකින් මහත්වූ නිහඬතාවයෙන් දිවි ගෙවති. රටේ පවත්නා සිවිල් යුද්ධය කිතුනුවන්ට බරපතල විපාක ගෙන දෙන්නට සමත්ව ඇත. සන්නද්ධ කංඩායම් කිතුනුවන්ට එරෙහිව සන්නද්ධ පියවර දිගින් දිගටම මුදා හරින් සිටී. ග්‍රාමීය පෙදෙස්වල කිතනුවන්ට එරෙහිවව සිදුකරන ප්‍රහාරයන් මහත් කනස්සල්ලෙන් දක්වා සිටී. කිතුනු හිසංනය පිටු දැකීමත් හිංසනයට විරුද්ධව පෙනී සිටීමටත් දැක්වූ සරංගලේ පන්ති මාලාවයි.

## සිරියාවේ කිතුනුවන්ට එරෙහි වධ බන්ධන



වසරින් වසර සිරියාවේ කිතුනුවන්ට එරෙහි හිංසනයන් ඉහළ යමින් පවතී. 2024 දෙසැම්බරයේදී අසාඩ් රෙජීමය වසර පනහකට අධික කාලයක් රට පාලනයෙන් පසු බිඳ වැටිණ. අල්කයිඩා ඉස්ලාමීය මූලධර්මවාදීන් හා සබඳතා පැවැත්වූ කංඩායම් රට තුළ හිස ඔසවන්නට පටන් ගැනීමත් සමග සාම්ප්‍රදායික කිතුනු කංඩායම්වලට කරදර හිරිහැර විඳින්නට විය. විශේෂයෙන් ඩෲස් හා අලාවිට්ස් වැනි සුළුතර කංඩායම් හා ගැටුම් වලදී කිතුනුවන් ඒවාට මැදිවීමෙන් බරපතළ විපාක විඳින්නට සිදුවිය.

හමුදා කංඩායම් ත්‍රස්තවාදී වේශයෙන් ඉස්ලාමීය රාජ්‍ය (ෂී) බලය ප්‍රචලිත කිරීමත් සමග රට පුරා දැඩි අනාරක්ෂිත බවක් මතුවී කිතුනුවන් එහි ප්‍රාණ ඇපකරුවන් බවට පත්විය. 2025 ජුනි මාසයේදී ඩමස්කස් අගනුවර දෙව්මැඳුරට ප්‍රහර එල්ල වූයේ මේ අතරතුරදීය. දැන් එරට ප්‍රදේශ මට්ටමින් අනාරක්ෂිත වෙමින් පවතී. දැනට උතුර හා නැගෙනහිර ආරක්ෂිතව පවතී. වෙරළබඩ තීරයේ කුඩා කිතුනු කංඩායම් සමාජ පීඩනයට ලක්ව ඇත. දකුණේ බරපතළ පීඩනයක් පවතී. ඩෲස් බහුතරයක් වෙසෙන පෙදෙස්වල කෲරත්වය සැහැසිය. ඩැමස්කස් හා ඇලෙප්පෝ හි තත්ත්වය දුඃඛදායකය. මේ නිසාම ඓතිහාසික වශයෙන් කිතුනුවන් බහුලව සිටි නගරවලින් කිතුනුවෝ පළා යති. ඉස්ලාමයෙන් හෝ ඩෲස් දහමින් ඉවත්ව කිතුනු ආගම වැළඳ ගැනීම බරපතළ විපාක මුළු පවුල්වලටම උදාකරන තත්ත්වයක් පවතී.

## එරිත්‍රියාවේ කිතුනු හිංසනයේ හැඩතල



ලෝකයේ ජේසුන් වහන්සේ ඇදහීමට වඩාත් දුෂ්කර ස්ථාන අතරින් එකක් වනුයේ එරිත්‍රියාවයි. රජය පිළිගෙන ඇත්තේ ආගමික කංඩායම් හතරක් පමණි. ඉන් බාහිර සියලු ආගම් හා කංඩායම් නීති විරෝධි ලෙස සැලකේ. කිතුනුවන් වන්දනාමාන කරනුයේ රජයෙන් තහනම් කර ඇති දෙව්මැඳුරුවල නොවන අතර එසේ කිරීම බලවත් අනිටු විපාකයන්ට මුහුණ පෑමට සිදුවන තත්ත්වයකි. බිහිසුණු පොලිස් වැටලීම්, අත්අඩංගුව ගන්නන්ට බරපතළ සිර දඬුවම් මෙන්ම කෲර සැලකිලිද නිසැකවම උරුමය.

ඉස්ලාමීය දහමෙන් හෝ එරිත්‍රියාන ඕතඩොක්ස් සභාවෙන් වෙනත් ආගම් වැළඳ ගැනීමට යෑම නිසා අදාළ තැනැත්තා හෝ තැනැත්තිය පමණක් නොව එම පවුල්ද ප්‍රතික්ෂේප වීමේත්, සමාජයෙන් පිටමං කිරීමේත් රාජ්‍ය වධ බන්ධනයට ගොදුරු වීමෙන් අනතුරට පාත්‍රවේ.

සමාජය මිලිටරිකරණය වීම නිසාම බරපතළ මර්දනයක් රට තුළ පවතී. සියලු ජන කොටස් සඳහා අනිවාර්ය හමුදා සේවා කාලයක් පවතින අතර ඉන් මිදී සිටීමට කිසිවකුටත් නොහැකිය. මේ ක්‍රියාවලියේදී හමුදා සේවය තුළ කිතුනුවකු වන්දනාවේ යෙදී හසුවුවොත් රාජ්‍ය වධ බන්ධනයට නියමවේ. කිතුනුවන්ට එරෙහි මේ ප්‍රචණ්ඩත්වය, කෲර වධ බන්ධන හා හිංසනය නිසා නීති විරෝධි ලෙස රටින් පළා යෑම හැර අන් විකල්පයක් නැත.

ශිරාන් මෛත්‍රී